# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1761/6 – 2012 ජුනි 06 වැනි බදාදා – 2012.06.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: 3/2/8/1/12.
ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය: එල්ඩී/05/2011/සීඊබී/327.

ඉහල කොත්මලේ ජලවිදුලි ව්‍යාපෘතිය යටතේ ද. වො. 220 අධිබල සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපනේ කෝරළේ සුළු කොට්ඨාසයේ, කලපිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.නු. 2798 දරන 2012 අප්‍රේල් මස 23 දිනැති මූලික පිඹුරේ දක්වා ඇති, ප්‍රමාණයෙන් හෙක්. 0.2648ක් පමණ වන පහත විස්තර කර ඇති ඉඩම:

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: වැවලියද්දේහේන; විස්තරය: විවෘත මුඩුබිම; මුල් හිමිකම් කියන අය: ඒ. එස්. ජේ. වීරසේකර, අංක 356ඒ 126, රුක්මල්ගම, කොට්ටාව; ප්‍රමාණය: හෙක්. 0.2648.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ජුනි මස 15 වැනි දින අනු අංක 1 පෙ.ව. 9.30 සිට ප.ව. 12.30 දක්වා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 ජුනි මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. එම්. එම්. යූ. බී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ.

2012 මැයි මස 30 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 679


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.